www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද නියෝජිතයා පකිස්ථානු ඒකාධිපතියාගේ "ප්‍රජාතන්ත්‍රවාදී දැක්ම" අගය කරයි

## US envoy lauds Pakistani dictator’s "democratic vision"

**කීත් ජෝන්ස් විසිනි**
**2007 නොවැම්බර් 19**

පසුගිය දෙසතිය පුරා පවත්වා ගෙන යනු ලබන යුද නීතිය යටතේ එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් ජෝන් නිග්‍රොපොන්ටේ සිය තුන් දින පකිස්ථානු සංචාරය අවසන් කල අතර ජෙනරාල් පර්වේස් මුෂාරෆ් හා ඔහුගේ මිලිටරි තන්ත්‍රයට බුෂ් පරිපාලනයේ දැඩි සහයෝගය නොවැම්බර් 18 දා පැවැත්වූ මාධ්‍ය සමුලුවේ දී යලි අවධාරනය කලේ ය.

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ දෙවැනියා වන නිග්‍රොපොන්ටේ මෙසේ ප්‍රකාශ කලේ යඃ "ජනාධිපති මුෂාරෆ්ගේ නායකත්වය යටතේ පකිස්ථානු ආන්ඩුව සමග අපගේ සහ ක්‍රියාකාරිත්වය අප අගය කරන්නෙමු."

"මැදහත්කම, සෞභාග්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදී පකිස්ථානයක් සඳහා" වන ආඥාදායකයාගේ "දැක්ම" බෙහෙවින් අගය කරන නිග්‍රොපොන්ටේගේ හැඳින්වීම මගින් ඇඟවුම් කලේ, පකිස්ථානු ජනතාවගේ අති මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි බුෂ් පරිපාලනය දක්වන නින්දිත සතුරුකම හා විරුද්ධත්වයයි.

"මුෂාරෆ්ගේ නායකත්වය යටතේ එම දැක්ම කරා ඉමහත් ප්‍රගතියක් පකිස්ථානය ඇති කරගෙන තිබේ" යයි නිග්‍රොපොන්ටේ අවධාරනය කලේ ය. " පසුගිය වසර කිහිපය පුරා පකිස්ථානු ජනතාව පුලුල් හා වඩාත් නිදහස් මාධ්‍යය ද, පෙර නුවූ විරූ ආර්ථික වර්ධනය ද, සංවර්ධනය හා ලිංගිකත්ව පදනමේ මැදහත් නීතිරීති මෙන් ම පාසැල් විෂය ධාරාවන් ද අත් දැක තිබේ. ජනාධිපති මුෂාරෆ් අන්තවාදයට එරෙහි ප්‍රබල හඬක්ව තිබුනු අතර ඉදිරියට ද එසේ වනු ඇත."

නොවැම්බර් 3 දින හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කල තැන් පටන් දහස් ගනනක් සිරගත කොට, අධිකරනය මැඩ නිදහස් භාෂනය, නිදහස් රැස්වීම හා නිදහස් ක්‍රියාකාරිත්වය තහනම් කොට ආන්ඩුවේ විරුද්ධවාදීන්ට දඬුවම් කිරීමට හමුදා අධිකරනය බල ගැන්වූ මුෂාරෆ්ට, තදින් අවවාද කිරීම සඳහා නිග්‍රොපොන්ටේගේ යෝජිත ඉස්ලාමාබාද් සංචාරය සිදුවන බව පසු ගිය සතියේ එක්සත් ජනපද හා බටහිර මාධ්‍යය සමස්තයක් ලෙස ම කියා සිටියේ ය.

නිග්‍රොපොන්ටේගේ මාධ්‍ය සමුලුව ආදර්ශවත් කල පරිදි යථාර්ථය නම්, ඔහුගේ සංචාරයෙහි අරමුන වූයේ මුෂාරෆ් ගලවාගැනීමටත් වඩා, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය හා පකිස්ථානු මිලිටරිය අතර පවතින දශක ගනනාවක සහක්‍රියාකාරිත්වය රැක ගැනීමත් ය. මුෂාරෆ් හා පක්ස්ථානු මිලිටරිය සමග කටයුතු කිරීමේ එක්සත් ජනපද නියෝජිතයා ලෙස නිග්‍රොපොන්ටේ නම් කිරීම ම වැදගත් කමක් දරයි. කොල්ලකාරී යුද්ධ දෙකක් ගෙන ගිය, ඇමරිකානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පුලුල් පරිමානයේ ප්‍රහාර එල්ල කල හා වක්‍රොත්තියෙන් වුවත් වධ දීමට ප්‍රසිද්ධියේ අනුබලය දුන් බුෂ් පරිපාලනය තුල පවා නිග්‍රොපොන්ටේ ට ඇත්තේ අධම, ලේවැකි දේශපාලන වාර්තාවකි. 1980 ගනන් මුල හොන්ඩුරාස්හි එක්සත් ජනපද තානාපති ලෙස ඔහු, වාමාංශිකයන්ට එරෙහි හොන්ඩුරාස් ආන්ඩුව ගෙන ගිය මෘග මර්දනයට ආවරනය සැපයූ අතර නිකරගුවාවේ සැන්ඩිනිස්ටා ආන්ඩුවට එරෙහි කොන්ට්‍රාවරුන්ගේ යුද්ධය සංවිධානය කිරීමට සහයෝගය දුන්නේ ය. ඉරා ක යුද්ධයට පෙර කාලයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එක්සත් ජනපද තානාපතිව සිටි නිග්‍රොපොන්ටේ ඉන් පසුව 2004 ජූනි සිට 2005 අප්‍රේල් දක්වා ඉරාකයේ තානාපති ලෙස කටයුතු කලේ ය.

18 දින නිග්‍රොපොන්ටේගේ මාධ්‍ය ප්‍රකාශනයෙහි, මුෂාරෆ් ගැන විවේචනයක් ලෙස පෙනී යාහැකි සුලු ඡේද දෙකක් පමනක් වෙන් වූ අතර ඔහු, පැනවූ මෑත කාල යුද නීතියත් මුෂාරෆ්ගේ අවශේෂ පාලන කාලයත් අතර ව්‍යාජ බෙදුම්කඩනයක් සනිටුහන් කලේය. 1999 කුමන්ත්‍රනයකින් බිහිවූ මුෂාරෆ් පාලන තන්ත්‍රය, පසු ගිය අට වසර තුල සමාජ විසංවාදය මෘග ලෙස මඩිමින් ද විවිධාකාර වංචනික මැතිවරන පවත්වමින් ද දැවැන්ත සමාජ අසමතාවක් හා ආර්ථික අනාරක්ෂිත භාවයක් නිර්මානය කල නව ලිබරල් ආර්ථික පිලිවෙත් ක්‍රියාවට නැගී ය.

ජනවාරි මුලට යෙදී ඇති ප්‍රාදේශීය හා ජාතික ව්‍යවස්ථාදායක මැතිවරනවලට පෙරාතුව හදිසි අවස්ථාව ඉවත් කල යුතු යයි නිග්‍රොපොන්ටේ මුෂාරෆ්ට

දන්වනු ඇතැයි රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීහු කියා තිබේ. එහෙත්, නිග්‍රොපොන්ටේ සමග පැවති දෙපැයක සාකච්ඡාවේ දී හදිසි අවස්ථාව ඉවත් කිරීම පිලිබඳව මොනම කාල වකවානුවක් සඳහන් කිරීම හෝ පිලිගැනීම ජෙනරාල්වරයා ප්‍රතික්ෂේප කල බව මැත මාධ්‍ය හමුවීම්වල දී හා ඔහුගේ ආධාරකරුවන්ගේ ප්‍රකාශනවල දී සඳහන්ව තිබේ. ඒ වෙනුවට ත්‍රස්තවාදී තර්ජනයේ වහන්තරාව යටතේ බුෂ් අවධාරනය කලේ "නිදහස් මැතිවරන" සහතික කල හැකි එකම ක්‍රමය සියලු දේශපාලන රැස්වීම් හා පෙලපාලි තහනම් කරන හා ආන්ඩුව විවේචනය කිරීමේ හේතුව මත දේශද්‍රෝහී චෝදනා මත දඬුවම් පැමිනවීම නො වේ නම් පුද්ගලයන් සිරගත කල හැකි ව්‍යවස්ථා විරෝධී පාලනයක් යටතේ පමනක් බවයි.

19 දින පැවති මාධ්‍ය සමුලුවේ ආරම්භක ප්‍රකාශයේ දී පසුපාදයට යමින් නිග්‍රොපොන්ටේ කියා සිටියේ "නිදහස් සාධාරන හා පිලිගතහැකි මැතිවරන සමග හදිසි නීති පාලනය අනුකූල නොවන " බවයි. එහෙත් ඉන් පසුව, ආන්ඩුව හදිසි නීතිය ඉවත් නොකල හොත් හා විරුද්ධ පක්ෂ සාමාජිකයන් නිදහස් නො කල හොත් කුමක් සිදු වේ දැයි මාධ්‍ය වේදියකු නැගූ ප්‍රශ්නයකට පිලිතුරු දෙමින් ඔහු "එමගින් සතුටුදායක මැතිවරන පැවැත්වීමට ඇති ආන්ඩුවේ හැකියාවට වල කපනු ඇතැයි" කියමින් ඉහත ප්‍රකාශය පවා හකුලුවා ලී ය.

## නිග්‍රොපොන්ටේ බූටෝ පිලිකෙව් කරයි

නිග්‍රොපොන්ටේ ගේ සංචාරයට ඔන්නමෙන්න තිබිය දී පකිස්ථානු මිලිටරි තන්ත්‍රය පකිස්ථානු ජනතා පක්ෂයේ (පීකේකේ) සභාපති හා හිටපු අගමැති බෙනාසීර් බූටෝ ද පකිස්ථානයේ ස්වාධීන මානව හිමිකම් කොමිසමේ ප්‍රධානී හා හිටපු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරිනියක් වන අස්මා ජාන්ගීර් ද නිවාස අඩස්සියෙන් නිදහස් කලේ ය. එය පෞද්ගලික රූපවාහිනී නාලිකා ගනනාවක විකාශයට ද ඉඩ හල නමුත් ඒ, ආන්ඩුව ප්‍රසිද්ධියේ විවේචනය කලහොත් මිලිටරියේ දන්ඩනයට ද සිරගත කිරීමට ද තර්ජනය කල කුරිරු නීති සංග්‍රහයක් පිලිපදින බවට එකඟවීමෙන් පසුව පමනි.

අනෙක් අතට මර්දනය සති අන්තය පුරා නොනැවතී ක්‍රියාත්මක වූයේ ආන්ඩු විරෝධී උද්ඝෝෂන බැටන් ප්‍රහාර, අත් අඩංගුවට ගැනීම් සමග පොලීසිය මැදිහත් ව මර්දනය කරමිනි. "රටේ නීතිය කඩන ඕනෑ ම අයෙකු යලි සිරගත කිරීමට හෝ දන්ඩනයට ලක් කරන" බවට 16 වන දින මුෂාරෆ් සහතික වෙමින් නිවේදනය කලේ ය. "කිසිවෙකුත් උද්ඝෝෂන ස්වරූපයෙන් හැසිරීම අප අනුමාන නො කරමු. මේ බව මම නිග්‍රොපොන්ටේට කියන්නෙමි."

හදිසි නීතිය පැනවීමට පෙර පකිස්ථානය තුලට කේබල් හරහා විකාශනයේ යෙදුනු ජියෝ ටීවී හා අරි යන පෞද්ගලික රූපවාහිනී නාලිකා දෙකෙහි විකාශන ඉස්ලමාබාදයේ බලපෑම මත ඩුබායි ආන්ඩුව විසින් අත්හිටවනු ලැබුනු අතර එයට විශාල පකිස්ථානු සංක්‍රමනික ජනතාවක් සිටින ගල්ෆ් රටවල පුලුල් ප්‍රේක්ෂකත්වයක් හිමිව තිබුනි.

16 දා නිග්‍රොපොන්ටේ බූටෝට දුරකථනයෙන් ඇමතූ නමුත් ඇය මුෂාරෆ් සමග සහයෝගී විය යුතු යයි ඔහු කල ඉල්ලීම ඉවත දැමූ පසුව ඔහු ඇය හමුවීම ප්‍රතික්ෂේප කලේය. නීග්‍රොපොන්ටේ වෙනත් විරුද්ධ පක්ෂයක නායකයන් කිසිවෙකුත් හමුවූයේ ද නැත. එය ආන්ඩුවට වොෂින්ටනයේ සහාය ප්‍රකට කල තවත් අවස්ථාවකි.

පසුගිය සිව් මස පුරාම බුෂ් පරිපාලනය මුෂාරෆ් හා බූටෝ අතර සමාදානයක් ඇති කිරීමට බොහෝ කාලයක් ද ශක්තියක් ද වැය කර තිබේ. එහි අපේක්ෂාව වූයේ, දේශපාලන බලයේ හා ආන්ඩුවේ අනුග්‍රහය ලබන ක්‍රියා දාමයක සැලකිය යුතු පංගුවක පීපීපීය කොටස්කරුවන් වීමට හිලව් වසයෙන්, එන්ට එන්ට ම හුදකලා වන හා අපකීර්තිමත් මිලිටරි තන්ත්‍රයට ප්‍රජාතන්ත්‍රවාදයේ සලුපිලි ඇන්දවිය හැකිය යන්න යි.

බූටෝ ඇගේ පාර්ශවයෙන් ප්‍රසිද්ධියේ ම එම කටයුත්ත සඳහා පෙනී සිටි අතර, ඇය සහභාගිවන ආන්ඩුව වත්මන් ආන්ඩුවටත් වඩා එක්සත් ජනපදයේ අභිප්‍රායන් වෙනුවෙන් කැපවෙන බව යලි යලිත් පැහැදිලි කලා ය. නිදසුනක් ලෙස, පකිස්ථානයේ ඇෆ්ගන් දේශ සීමා ප්‍රදේශයන්හි මිලිටරි ක්‍රියාන්විතයන් විවෘතව ම සියතට ගැනීමට එක්සත් ජනපද හමුදාවන්ට ඉඩ ලබා දෙන බව ඇය කියා සිටියා ය.

මුෂාරෆ්ගේ යුද නීතිය ඇටවීමෙන් පසුව බූටෝ, බුෂ් පරිපාලනයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් මගහැරී අතර ආන්ඩුව සමග තිරයට පසුපසින් සම්බන්ධකම් දිගට ම පවත්වා ගත්තා ය. එහෙත් ආන්ඩුව විසින් ඇය දෙවරක් ම නිවාස අඩස්සියේ තැබීමෙන් හා දහස් ගනනක් පීපීපී සාමාජිකයන් අත් අඩංගුවට ගැනීමෙන් පසුව, මුෂාරෆ් සමග ආන්ඩුව ගෙන යාමට පුලුවන් බව නිවේදනය කිරීමට ඇයට සිදුවුනු අතර ජෙනරාල්වරයා "ඉවත් කිරීමට" පහසුකම් සලසන ලෙස එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටියා ය.

15 වන දින නිවාස අඩස්සියේ සිටිය දී බූටෝ හමුවූ ලාහෝර්හි එක්සත් ජනපද තානාපති නිලධාරි බ්‍රයන් හන්ට් මුෂාරෆ් හා මිලිටරිය සමග යලි සාකච්ඡාවක් අරඹන ලෙස ඇයට ඒත්තු ගැන්වීමට උත්සාහ කලේය. ඇසෝසියේටඩ් ප්‍රෙස් වාර්තාවකට අනුව ඇය ඔහුට පවසා ඇත්තේ එය "ඉතා දුෂ්කර" බවය. ඒ අතර ම ඇෆ්ගනිස්ථානය වාඩි ලා ගත්තා වූ ද සෑම පකිස්ථානු මිලිටරි ආඥාදායකත්වයකට ම

අනුග්‍රහය දැක්වූ ද එක්සත් ජනපදය හා මුෂාරෆ් සමග කේවල් කිරීමේ ඇයගේ සූදානම නිසා බූටෝ ඇගේ විශ්වසනීයත්වය හා සහයෝගය විශාල බාධනයකට ලක්ව තිබෙනු අත්දකියි.

ඔහුගේ පාර්ශවයෙන් මුෂාරෆ්, බූටෝ ගැන කතා කරන්නේ වඩවඩාත් අවඥා සහගතව ය. වොෂින්ටන් පෝස්ට් පත්‍රය සමග 16 දින පැවැත්වූ හමුවක දී ඇය "වඩා ගැටුම්කාරී" ව සිටින්නේ ය යන හේතුව මත ඇය සමග තව දුරටත් සාකච්ඡා කිරීම බැහැර කල ඔහු තම පාලනයට එල්ල වන ඇයගේ අභියෝගය මඩින බවට සහතික විය. ඩෝන් පත්‍රයට අනුව ඔවුන්ගේ සාකච්ඡාව තුල නිග්‍රොපොන්ටේ ට ද ඔහු එම පනිවිඩය ම දී තිබේ.

ඉරිදා ප්‍රකාශය තුල නිග්‍රොපොන්ටේ "ඉතාම පලදායී ඉදිරි මාවත ලෙස, දේශපාලන මැදහත් මතධාරින් දෙදෙනා අතර සමාදානයකට ඔවුන් උනන්දු කල" බවය. (වොෂින්ටනය මුෂාරෆ් හා බූටෝ ගැන කතා කරන්නේ එලෙස ය.) එහෙත් පීපීපී නායිකාව හමු වීමට අසමත් වීමත්, මුෂාරෆ්ව ඉහලින්ම වර්නනා කිරීමේදීත් නිග්‍රොපොන්ටේගේ "සියලු පක්ෂ අනුගමනය කල යුත්තේ රතු ඉර පැනීම හා ගැටුමට එලඹීමේ මග නොව සාකච්ඡා මාර්ගයයි" යන කැඳවීම එල්ල කර ඇත්තේ ප්‍රධාන කොට ම බූටෝ වෙත මිස, මර්දනකාරී රැල්ලක් මත ජනාධිපතිව හිඳිමින් යුද නීතිය පැනවූ ජෙනරාල්වරයා වෙත නො වේ.

මුෂාරෆ් යුද නීතිය පැනවූ තැන් පටන් බුෂ් පාලනාධිකාරයේ නිලධාරින් කියා ඇත්තේ ඉස්ලමාබාදය මත සිය හස්තයට බරපතල සීමාවන් පැනවී ඇති බවත්, තමන්ට කල හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදය කරා එලඹෙන ලෙස පකිස්ථානු මිලිටරියට ආයාචනා කිරීම පමනක් බවත් ය. එවන් ප්‍රකාශ හාස්‍ය ජනක ය. ඉස්ලමාබාදයට බලපෑම් කිරීමට එක්සත් ජනපදයට අවශ්‍ය නම් එය හා බටහිර බලවතුන් සතුව ඒ සඳහා උපකරන රාශියක් ඇත. පකිස්ථානු ආන්ඩුවට ආර්ථික හා දේශපාලන බලපෑම් කිරීමට ඒ අනුව හැකිය. පසු ගිය සය වසර පුරා පකිස්ථානයට සපයා ඇති බවට වොෂින්ටනය පිලිගන්නා ඩොලර් බිලියන 10 න් වැඩි පංගුවක් සාක්කුවේ දමාගත් පකිස්ථානු මිලිටරියට පෙන්ටගනය සමග දශක ගනනාවක් දිග සමීප සබඳතාවක් ඇත.

එක්සත් ජනපදයේ වැදගත් මූලෝපායික අවශ්‍යතාවන් පරදුවට තැබී ඇතැයි දැක ගත් කල්හි බුෂ් පරිපාලනයට, මුෂාරෆ් හා පකිස්ථානු මිලිටරියට තර්ජනය කිරීමේ මද පැකිලීමක් නොතිබුනි. නිග්‍රොපොන්ටේගේ පූර්වගාමියා වූ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආමිටේජ් , 2001 සැප්තැම්බරයේ දී ප්‍රකාශ කලේ, පකිස්ථානය තලේබාන් පාලනය හා සම්බන්ධකම් අත් නොහරින්නේ නම් හා එක්සත් ජනපදයේ ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයට මෙහෙයුම් ආධාර සම්පාදනය නොකරන්නේ නම් එරට ගල් යුගයට ඇද දමන බෝම්බ පකිස්ථානයට එල්ල කරන බව යයි මුෂාරෆ් සිය චරිතාපදානයෙහි කියා සිටියි.

යථාර්ථය නම් බුෂ් පරිපාලනය ද සමස්තයක් ලෙස එක්සත් ජනපද සංස්ථාපිතය ද, මුෂාරෆ් තන්ත්‍රයට එරෙහි ජනතා අරගලයක්, මිලිටරිය තුල දෙදරීම් ඇති කරමින් ද පීපීපීයේ මෙන් ම අනෙකුත් සම්ප්‍රධායික ධනපති පක්ෂවල ග්‍රහනය ඉවත දමමින් ද සමාජ නැගිටීමකට තුඩු දෙනු ඇතැයි භීතියට පත්ව සිටියි.

අඩුම ලංසුවෙන් එවන් වර්ධනයක් ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද යුද්ධය බරපතල ලෙස කඩාකප්පල් කරනු ඇත. ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද හමුදා විසින් ප්‍රයෝජනයට ගන්නා තෙල්වලින් හරි අඩක් ම ද අනෙකුත් සැපයුම්වලින් බොහොමයක් ම ද ලබාගත්තේ පකිස්ථානය හරහා ය. එසේ ම ඉරානයට එරෙහි එක්සත් ජනපද යුද සැලසුම් ද කඩාකප්පල් කරනු ඇත.

බුෂ් පරිපාලනය මෙන් ම එක්සත් ජනපදයේ කටයුතු දූෂ් කලමනාකරනය කිරීම පිලිබඳව බුෂ් පරිපාලනය ගැන මැසිවිලි නගන නමුත් ඩිමොක්‍රැටිකයන් ද, මුෂාරෆ්ගේ හා පකිස්ථානු මිලිටරිය පිටිපස පෙල ගැසෙන්නේ එබැවින් ය.

කෙසේ වුව ද බුෂ් පාලනාධිකාරය, මුෂාරෆ් ට එරෙහි මහජන විරෝධය නැගෙන තත්වයක දී, වෙනත් විකල්පයක් ද එනම්, දේශපාලනිකව පිලිගත හැකි වෙනත් ජනරාල් කෙනෙක් මගින් ඔහු විස්ථාපනය කිරීම වැනි, සලකා බලමින් සිටියි. මාධ්‍ය වාර්තාවලට අනුව නිග්‍රොපොන්ටේ සිය තෙදින සංචාරයේ දී, මුෂාරෆ් විසින් තමාගෙන් පසු හමුදා ආඥාපති තනතුරට නම් කර ඇති ජෙනරාල් **අෂ්ෆක් කියානි** තෙවතාවක් ම හමු වී තිබේ. මෙය වාර්තා කරන වොෂින්ටන් පෝස්ට් පුවත්පත නිරීක්ෂනය කලේ "කියානි සමග නිග්‍රොපොන්ටේගේ හමුවීම, එක්සත් ජනපදය සිය ත්‍රස්තවාදයට එරෙහි සටනේ දී හවුල්කරුවෙක් විය හැකි හා රටේ ස්ථාවරත්වය තබා ගත හැකි අනෙකුත් නායකයන් දිනා ගැනීමට බලාපොරොත්තු වන බවට සලකුනක් බව විශ්ලේෂකයන් ප්‍රකාශ කර ඇත" යනුවෙනි.

වියහැක්කේ කුමක් වුවත් පකිස්ථානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය හා සමාජ අපේක්ෂාවන් අවුරා ලීමට වොෂින්ටනය අධිෂ්ඨාන කරගෙන සිටියි.